7 ශ්‍රේණිය

# විද්‍යාව

**මාසික පරීක්ෂණ - අංක 03**

නම : ..............................................................................................................................

පන්තිය : ........................................................ පන්ති අංකය : ....................................................

## I කොටස

✶ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) අම්ලයක්, භෂ්මයක් හා උදාසීන ද්‍රව්‍යක් පිළිවෙලින් දැක්වෙන්නේ,

I. මද්‍යසාර, සබන් දියර, ජලය II. විනාකිරි, හුණු දියර, ජලය

III. දෙහි යුෂ, ලුණු දියර, හුණු දියර, IV. අළු දියර, භූමිතෙල්, සබන් දියර

(02) නිල් ලිට්මස් කඩදාසි වල වර්ණය වෙනස් නොකරන ද්‍රව්‍යය වන්නේ,

I. දෙහි යුෂ II. විනාකිරි

III. සබන් දියර IV. සල්ෆියුරික් අම්ලය

(03) අම්ල භෂ්ම හඳුනා ගැනීමට නිවසේදී සාදා ගත හැකි දර්ශකයක් නොවන්නේ,

I. සබන් දියර II. නිල් කටරොළු මල් යුෂ

III. රතු පොකුරු වද මල් යුෂ IV. කහ දියර

(04) වැරදි ප්‍රකාශය තෝරන්න.

I. මී මැස්සකු දෂ්ට කල විට ආප්ප සෝඩා ආලේප කරයි.

II. වද මල් යුෂවලට දෙහි යුෂ එකතු කළ විට දීප්තිමත් රතු පැහැයක් ලැබේ.

III. පසෙහි ආම්ලිකතාව අඩු කිරීමට පසට හුණු එකතු කරයි.

IV. දෙබරෙකු දෂ්ට කළ විට සබන් ආලේප කරයි.

(05) විද්‍යාගාරයේ භාවිත වන එක්තරා දර්ශකයක් අම්ලයකට එකතු කළ විට රතු පැහැයකුත් භෂ්මයකට එකතු කළ විට කහ පැහැයකුත් ලබා දුනි. එම දර්ශකය විය හැක්කේ,

I. ෆිනොප්තැලින් II. මෙතිල් ඔරේන්ජ් III. රතු ලිට්මස් IV. pH කඩදාසි

(06) අම්ලයක ද්‍රාවණ සඳහා pH කඩදාසි මගින් ලැබෙන අංක පරාසය,

I. අංක 1 - 6 දක්වා වේ. II. අංක 8 - 14 දක්වා වේ.

III. අංක 7 වේ. IV. අංක 1 - 14 දක්වා වේ.

(07) අපෘෂ්ඨවංශීන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

I. බත්කූරා, ලේනා, වවුලා II. ගිරවා, හාවා, මීයා

III. ගොළුබෙල්ලා, සමනලයා, ඉස්සා IV. ගැරඬියා, කකුළුවා, බෙල්ලා

(08) ජීවීන් තම පැවැත්ම සඳහා පරිසරයට දක්වන හැඩගැසීම් හඳුන්වන්නේ,

I. වර්ගීකරණය ලෙස ය. II. අනාකූල හැඩය ලෙස ය.

III. අනුවර්තන ලෙස ය. IV. වෛශාන්තරය ලෙස ය.

CamScanner

(09) උභය ජීවීන් පමණක් සිටින පිළිතුර වන්නේ,

I. ගෙම්බා, ඉබ්බා, කැස්බෑවා
II. මැඩියා, පණුගෙම්බා, සලමන්දරා
III. මැඩියා, කිඹුලා, සලමන්දරා
IV. ගෙම්බා, කැස්බෑවා, කටුස්සා

(10) 

රූපයේ දැක්වෙන හෘදය සහිත සත්ත්ව කාණ්ඩය වන්නේ,

I. උරගයින් හා ක්ෂීරපායින්
II. මත්ස්‍යයින් හා උරගයින්
III. පක්ෂීන් හා උභය ජීවීන්
IV. පක්ෂීන් හා මත්ස්‍යයින්

✱ පහත දැක්වෙන හිස්තැන් සඳහා සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

(ෆිනොප්තැලීන්, වේශාන්තරය, සෝඩියම් හයිඩ්රොක්සයිඩ්, පෘෂ්ඨවංශීන්, දර්ශක, සංවරණය, ක්ෂීරපායි, විලෝපීයයන්, සල්ෆියුරික් අම්ලය, දෙබෙදුම් සුචි)

(11) අම්ල හා භෂ්ම සමඟ වෙනස් වර්ණ ලබා දෙන ද්‍රව්‍යය ...................................... නම් වේ.

(12) කෝටු වන්දා ...................................... දක්වන සත්ත්වයෙකි.

(13) කොඳු ඇට පෙළක් ඇති සතුන් ...................................... නම් වේ.

(14) ...................................... විද්‍යාගාරයේ දී අම්ල, භෂ්ම, හඳුනා ගැනීමට භාවිත කරයි.

(15) pH කඩදාසි දැමූ විට දම් පැහැති වර්ණය ලබා දෙන ද්‍රව්‍යයකි. ......................................

(16) ජලයේ සහ වාතයේ ජීවත්වන සතුන්ට ...................................... සඳහා අනාකූල හැඩය උපකාරී වේ.

(17) ...................................... විද්‍යාගාරයේ ඇති ප්‍රබල භෂ්මයකි.

(18) තණකොළ පෙත්තාගේ ශරීර වර්ණය ...................................... ගෙන් ආරක්ෂා වීමට උපකාරී වේ.

(19) වවුලා පියාසර කළ හැකි ...................................... සත්ත්වයෙකි.

(20) බාහිර ලක්ෂණ යොදා ගනිමින් ජීවීන් කාණ්ඩ කිරීමට ...................................... යොදා ගනී.

3 වන මාසික ඇගයීම

I කොටස

1. ii 2. iii 3. i 4. iv 5. ii 6. i 7. iii 8. iii 9. ii 10. iv 11. දර්ශකය 12. වේශාන්තර
13. පෘෂ්ඨවංශීන් 14. ෆිනොප්තැලීන් 15. සෝඩියම් හයිඩ්රොක් සයිඩ් 16. සංවරණය
17. සල්ෆියුරික් අම්ලය 18. විලෝපීයයන් 19. ක්ෂීරපායින් 20. දෙබෙදුම් සුචි (ලකුණු 2X10=20 )